01 මම විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්මි. ජ්‍යෙෂ්ඨ ශිෂ්‍යයන් කිහිපදෙනෙක් විසින් මා බිය ගන්වා යම් යම් කටයුතු කිරීමට මා පොලඹවාලයි. එය මා හට මහත් හිරිහැරයකි. මේ සඳහා නීතිමය උපදෙස් පතමි.

1998 අංක 20 දරන නවක වධ වැළැක්වීමේ පනතේ 3 වැනි වගන්තිය ප්‍රකාරව යමක් කිරීමට හෝ නොකිරීමට බිය ගැන්වීම වසර 5ක් දක්වා බරපතළ වැඩ සහිතව සිර දඬුවම් නියම් කළ හැකි වරදක් වෙයි.

එබැවින් ඔබට මේ සම්බන්ධයෙන් පොලිසියට පැමිණිල්ලක් කිරීම මඟින් නීතිමය ක්‍රියාමාර්ගයකට අවතීර්ණ වීමේ හැකියාව තිබේ.

02 මා විවාහක තැනැත්තකු වන අතර මාගේ කිසිදු වරදකින් තොරව බිරිය ඇයගේ වුවමනාවට නිවෙසින් පිටවී ගොස් මා හට විරුද්ධව නඩත්තු නඩුවක් පවරා ඇති අතර දරුවාද මා සමඟ සිටී. දරුවාගේ සියලු අවශ්‍යතා මා විසින් සම්පූර්ණ කරන අතර මා බිරියට නඩත්තු මුදලක් ගෙවිය යුතුද?

ඔබ දන්වා ඇති ආකාරයට 1999 අංක 37 දරන නඩත්තු පනතට අනුව ප්‍රමාණවත් වත්කමක් ඇති සැමියකු විසින් ප්‍රමාණවත් හේතුවක් නොමැතිව බිරියව නඩත්තු කිරීම පැහැර හරින සැමියකු සම්බන්ධයෙන් බිරියට මාසිකව නඩත්තු මුදලක් ගෙවිය යුතු බවට සඳහන් කරයි.

නමුත් එවැනි නඩත්තු ඉල්ලීමක් අධිකරණයට ඉදිරිපත් කරන අවස්ථාව වන විට බිරිය අනාචාරයේ ජීවත් වන බව ඔප්පු කිරීමට හැකියාව තිබේ නම් එලෙස නඩත්තු දීමනා ගෙවීමට නියෝග කරනු නොලැබේ.

බිරිය මෙවැනි නිවෙස අතහැර ගියේ සැමියාගේ හිරිහැර, අඩන්තේට්ටම් නිසා හා ඇයගේ ජීවිතයට අනතුරක් විය හැකි බවට වූ භීතිය නිසා නම් අවස්ථානුගත කරුණු මත ඉහත නීතිමය තත්ත්වය වෙනස් වෙයි.

ප්‍රමාණවත් වත්කමක් ඇති සැමියකු විසින් බිරිය නඩත්තු කිරීම අසාධාරණ හා අයුක්තිසහගත ලෙස ප්‍රතික්ෂේප කරන්නේ නම් එවැනි විටකදී නඩත්තු මුදලක් ගෙවීමට සැමියා බැඳී සිටී.

මෙහිදී බිරිය තමාට තමාව නඩත්තු කර ගැනීමට හැකියාවක් නොමැති බව හා සැමියාට ප්‍රමාණවත් වත්කමක් ඇති බව හා නඩත්තු කිරීම පැහැර හරින බව බිරිය විසින් ඔප්පු කළ යුතු වෙයි.

03 පුරාවස්තු සොයා ගැනීම සඳහා කැණීම් කිරීමට නීතිමය අවසර ලබාගත හැකි වන්නේ කෙසේද? නීතිමය තත්ත්වය කුමක්ද?

පුරාවිද්‍යා අධිකාරිය ජනරාල්වරයාගේ බලපත්‍රයක් ලබා නොගෙන කිසිදු කැණීමක් කිරීමට පුරාවස්තු ආඥා පනත යටතේ අවසර නොලැබේ.

එය ඔබගේ පෞද්ගලික දේපළක් වුවද බලපත්‍රයක් නොමැතිව පුරාවස්තු සෙවීම සඳහා කැණීම් කිරීමට බලයක් හෝ අවසරයක් නොමැත.

තවද කැණීම් බලපත්‍රයක් නොමැතිව පුරාවස්තුවක් සොයා ගන්නා ඕනෑම අයකු විසින් ඒ පිළිබඳව වහාම පොලිස් ස්ථානය වෙත හෝ ග්‍රාම නිලධාරිවරයා වෙත වාර්තා කළ යුතු අතර අදාළ පුරාවස්තුව ඔවුන් වෙත භාරදීමට හැකියාවක් තිබේ නම් එය භාරදීමද කළ යුතු වෙයි.

තවද එවැනි සොයා ගැනීමකින් දින 7ක් තුළ එකී සොයා ගැනීම පිළිබඳ දිස්ත්‍රික් ලේකම්වරයා වෙතද වාර්තා කළ යුතු වෙයි.

නමුත්

1. බලපත්‍රයක් ලබානොගෙන පුරාවස්තු සෙවීම සඳහා කැණීම්වක් කරන්නේ නම්, හෝ
2. කැණීම් සඳහා ලබාදුන් බලපත්‍රයේ කොන්දේසි උල්ලංඝණය කරමින් කටයුතු කරන්නේ නම්, හෝ
3. බලපත්‍රය යටතේ කැණීම් කර සොයා ගත් පුරාවස්තු පිළිබඳව වාර්තා නොකරයි නම්, හෝ
4. බලපත්‍රයක් නොමැති වූ අවස්ථාවකදී සොයා ගත් පුරාවස්තුව පිළිබඳ ඉහතින් දක්වා ඇති ආකාරයට වාර්තා නොකරයි නම්, හෝ
5. බලපත්‍රයක් නොමැතිව කැණීමක් කර පුරාවස්තු සොයා ගත් අවස්ථාවක් ගැන දැන සිටීන, එසේ නැත්නම් දැන සිටීමට සාධාරණ හේතු ඇති අවස්ථාවක නියෝජිතයකු ලෙසින් හෝ තමුන් විසින්ම ඒ පුරාවස්තුව මිලට ගැනීම හෝ ඉවත් කිරීමට කටයුතු කිරීම මෙන්ම තමන් සතු කර ගැනීමට කුමනාකාරයෙන් හෝ කටයුතු කරයි නම් එය දඩ සහ/ හෝ දෙයාකාරයකින් එක් ආකාරයක සිර දඬුවම් ලබා දිය හැකිය.

04 රිය අනතුරු සම්බන්ධයෙන් වන්දි මුදල් අය කර ගැනීම සඳහා නඩු පැවැරිය යුතු කාලය කුමක්ද?

රිය අනතුරු සම්බන්ධයෙන් සිදු වූ හානි හෝ තුවාල හෝ මියයෑම සම්බන්ධයෙන් හෝ වන්දි ඉල්ලා දිසා අධිකරණයක සිවිල් නඩුවක් පවරාදීම සම්බන්ධයෙන් වන විටදී, රිය අනතුර සිදු වී වසර දෙකක් ඉක්ම වීමට පෙර වන්දි ඉල්ලා නඩු පැවැරීමට අදාසත් කරන්නේ නම් නඩු පැවැරිය යුතු වෙයි.

මෙම වසර දෙකක කාලය ඉකුත් වීමෙන් පසු එම අනතුර සම්බන්ධයෙන් වන්දි ඉල්ලා නඩු පැවැරීමට ඇති අයිතිය ගිලිහී යයි.

05 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ තොරතුරු ලෙස ලබා ගත හැක්කේ මොනවාද?

තොරතුරු දැනගැනීමේ පනතේ 43 වන වගන්තිය වන ඇර්ථ නිරූපණ වගන්තියට අනුව තොරතුරු යන්නට, පහත සඳහන් දේ ඇතුළත් වෙයි.

සටහන්, ලේඛන, සන්දේශ, විද්‍යුත් තැපෑල්, උපදේශන, මාධ්‍ය නිවේදන, චිත්‍රලේඛ, නියම්, ලොග් පොත්, ගිවිසුම්, වාර්තා, ප්‍රවෘත්ති පත්‍ර, සාම්පල්, ආදර්ශක, භූමිමාරු වන ලිපි, සන්දේශ, නීති කෙටුම්පත්, පොත්, පිණ්ඩිත, සිතියම්, එතු, රූප සටහන්, රූපමය හෝ ප්‍රස්තාරමය වැඩ හෝ ඡායාරූප, සේයා පට, ශබ්ද පටිගත කිරීම්, වීඩියෝ පට, යන්ත්‍ර මඟින් කියවිය හැකි වාර්තා, පරිගණක වාර්තා සහ වෙනත් ලේඛනගත ද්‍රව්‍ය ඇතුළු යම් ආකාරයකින්, ලේඛන ගත කරන ද්‍රව්‍ය සහ ඒවායේ යම් පිටපත් යනාදිය ඇතුළත් වෙයි.

එහිදී ඒවායේ භෞතික ස්වරූපය හෝ ස්වභාවය නොසලකා හරී.

06 මාගේ සැමියා මා සහ දරුවා අතහැර ගොස් වෙනත් විවාහයක් දැනට සිදු කරගෙන ඇති අතර එම කාන්තාව සමඟ ජීවත් වෙයි. මා සහ දරුවා නඩත්තු නොකරයි. නීතියේ පිහිට පතමි

ඔබගේ විවාහය ලියාපදිංචි කළ වලංගු විවාහයක් නම් සහ ඔබට අවැසි නම්

සැමියාගෙන් දික්කසාදය ඉල්ලා දික්කසාද නඩුවක් ගොනු කිරීමේ හැකියාව තිබේ.

දරුවා වයස අවුරුදු 18ට අඩු බාල වයස්කාර දරුවකු හෝ වයස අවුරුදු 18ට වැඩි වුවත් ආබාධිත නම් වුවද හෝ උසස් අධ්‍යයනය හදාරන්නේ නම්, දරුවා නඩත්තු කරන ලෙසට ඉල්ලා සැමියාට විරුද්ධව නඩත්තු නඩුවක් ගොනු කිරීමේ හැකියාවද තිබේ. මෙහිදී සැමියා විසින් දරුවාගේ හා තමාගේ නඩත්තු පහසර හැර ඇත්නම් දෙදෙනා වෙනුවෙන්ම නඩත්තු ඉල්ලීමක් කිරීමේ හැකියාව තිබේ.



GUIDELINE
Right එක දැනගෙන Fight කරන්න

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය

ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවැළැක්වීමේ පනත ලංකා නීති ඉතිහාසයේ විශේෂ සන්දර්භයක් ලෙස දැක්විය හැකිය. දීර්ඝ කාලයක් තිස්සේ ස්ත්‍රී ව්‍යාපාරය හා මානව හිමිකම් ක්‍රියාකාරීන් විසින් කරන ලද ඉල්ලීම් හා නොනැවිතුණු උත්සාහයේ ප්‍රතිඵලයක් ලෙස ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව ක්‍රියා වැළැක්වීමේ පනත 2005-08-09 වන දින පාර්ලිමේන්තුවේ සම්මත වන ලදී.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්වයක් යනු පීඩාවට පත් තැනැත්තා සහ පීඩාව සිදු කරන තැනැත්තා අතර ඇති පෞද්ගලික ස්වභාවයේ සම්බන්ධතාවක ප්‍රතිඵලයක් ලෙස යම් තැනැත්තකු ශාරීරික වශයෙන් හෝ මානසික වශයෙන් පීඩාවට ලක් කිරීමයි. මෙකී පීඩාව නිවෙසේ පරිසරය තුළදීම සිදු කිරීම අවශ්‍ය නොවන අතර නිවෙසින් පිටතදීත් සිදු කළ හැකිය.

පීඩාවට ලක්වන පුද්ගලයාගේ ශාරීරික ඉලක්ක කර ගැනීමින් සිදු කරන කාන්තාවගේ අකැමැත්තෙන් ගබිසා කිරීම, මිනී මැරීමට තැත් කිරීම, ළමයින්ව කාන්තස්වයා භාජන කිරීම, තුවාල කිරීම, බරපතළ තුවාල සිදු කිරීම, අයුතු ලෙස සිර කර තැබීම, බලහත්කාරය, සාපරාධී බලහත්කාරය, අඩන්තේට්ටම් කිරීම, ලිංගික අතවර කිරීම, ළමයින්ගේ අයුතු ලිංගික ප්‍රයෝජන ගැනීම, අස්වාභාවික වැරදි, බරපතළ ලිංගික අපරාධපතයන්, සාපරාධී බිය ගැන්වීම වැනි ක්‍රියාවන් ශාරීරික පීඩාවන් වශයෙන් හැඳින්විය හැකිය.

එසේම ගෘහස්ථ හිංසනය යන්නට ශාරීරික වශයෙන් කරන්නා වූ පීඩා පමණක් නොව මානසික වශයෙන් හිංසනයට ලක් කිරීමද අයත් වේ. පහතින් දක්වා ඇති පරිදි යම් උදාහරණයිලි බැනවැදීම් යන්න මෙකී මානසික පීඩාව යන්නට අදාළ වේ. යම් අයකු පීඩාවට පත් කළ හැකි ක්‍රම කිහිපයකි.

බරපතළ ස්වභාවයේ නින්දා කිරීම් සහ අපහාස කිරීම්, පරාජය වන තෙක්ම බැන වදදීම්, බරපතළ ක්ෂණික පීඩාවක් ඇති කරන ක්‍රියාවන් කිරීම මානසික වශයෙන් හිංසනයට ලක් කිරීමේ ලෙස දැක්විය හැකිය.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව ක්‍රියාවන් වැළැක්වීම සඳහා මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු පැවැරිය හැකිය.

පීඩාව කරන තැනැත්තා විසින් සිදු කරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව වැළැක්වීම සඳහා ආරක්ෂක නියෝගයක් ඉල්ලා සිටිය හැකිය. එසේම ආරක්ෂක නියෝගයක් තුළ පීඩාවට පත් තැනැත්තාගේ ආරක්ෂාව සහතික කරන ලෙස නියෝග කිරීමට හැකියාව ඇති අතර මෙයට අතිරේකව පීඩාවට ගොදුරු වූ තැනැත්තාගේ සෞඛ්‍යය හා සුඛසාධනයට අදාළ යම් නියෝග නිකුත් කිරීමටද හැකියාව ඇත.

පීඩාවට පත් වූ තැනැත්තා වැඩිහිටියකු වන විට,

- පීඩාවට පත් තැනැත්තා විසින්,
- පොලිස් නිලධාරියකු විසින්,
- ආරක්ෂක නියෝගයක් ඉල්ලා සිටීමේ හැකියාව ඇත.

පීඩාවට පත් තැනැත්තා ළමයකු වන විට,

- ළමයාගේ මව්පියන්ගෙන් කෙනකු විසින්,
- භාරකරුවකු විසින්,
- ළමයා පදිංචි ස්ථානයේ පදිංචි තැනැත්තකු විසින්,
- ජාතික ළමා ආරක්ෂක අධිකාරිය විසින්,
- පොලිස් නිලධාරියකු විසින්,
- ආරක්ෂක නියෝගයක් ඉල්ලා සිටීමේ හැකියාව ඇත.

ගෘහස්ථ ප්‍රචණ්ඩත්ව ක්‍රියා වැළැක්වීමේ පනත යටතේ පීඩාවට පත්වන තැනැත්තා විසින් සහන ඉල්ලා සිටීමේදී ස්ත්‍රී - පුරුෂ භේදයකින් තොරව සහන ඉල්ලා සිටීමේ හැකියාව ඇත. මීන් පහත විස්තර කරන නඩෙන් සබඳතාවලට අයත්වන අය එකී සබඳතාව උපයෝගී කරගෙන එක් පාර්ශ්වයක් අනෙක් පාර්ශ්වය වෙත ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කරයි නම් ඒ අපට විරුද්ධව නඩු පැවැරිය හැකිය.

- සැමියාට හෝ බිරියට,
- පෙර විවාහයේ සැමියාට හෝ බිරියට,
- තමා සමඟ එකට ජීවත්වන සහකරුට හෝ සහකාරියට,
- පීඩාවට පත් තැනැත්තාගේ හෝ විවාහක සහකරුගේ, පෙර විවාහ සහකරුගේ හෝ තමා සමඟ සහවාසයේ යෙදෙන තැනැත්තාගේ යන සබඳතාවලින් යුත් අයට විරුද්ධව
- පියා, මව, සීයා, ආච්චි, සුළු මව, සුළු පියා
- පුතා, පුව, මුනුපුරා, මිනිපිරිය, සුළු පුතා, සුළු දියණිය
- සහෝදරයා, සහෝදරිය, අර්ධ සහෝදරයා, අර්ධ සහෝදරිය, සුළු සහෝදරිය, සුළු සහෝදරයා
- මවුපියන්ගේ සහෝදර සහෝදරියන්
- සහෝදරයකුගේ හෝ සහෝදරියකගේ ළමයා
- මවුපියන්ගේ සහෝදරයකුගේ හෝ සහෝදරියකගේ ළමයා

ආරක්ෂක නියෝගයක් ලබාගැනීම සඳහා ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් එම ඉල්ලීම සිදු කරන අවස්ථාවේදීම සිදුවී තිබීම අත්‍යවශ්‍ය නොවේ. පීඩාවට පත් තැනැත්තා හට අනාගතයේ ඇති විය හැකි ඉඩ ඇති ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව වැළැක්වීමට අධිකරණයෙන් ආරක්ෂක නියෝගයක් ඉල්ලා සිටිය හැකිය. උදාහරණයක් වශයෙන් මරණ බවට තර්ජනය කර ඇති විට ආරක්ෂාව තකා මෙකී නියෝගයක් ඉල්ලා සිටිය හැකිය.

- ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු කර ඇති විට (අතීතා)
- ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු කරමින් පවතිය විට (වර්තමාන)
- ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවක් සිදු කිරීමට ආසන්න අවස්ථාවකදී (අනාගත)

මෙකී ආරක්ෂක නියෝගයක් ඉල්ලා සිටිය හැකිය.

නඩුවක් අධිකරණයේ ගොනු කළ පසු ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාව සිදුවීම වැළැක්වීමේ හදිසි අවශ්‍යතාව හා ආරක්ෂාව සහතික කිරීමේ අවශ්‍යතාව සැලකිලිමුව ගෙන අතුරු ආරක්ෂක නියෝගයක් නිකුත් කිරීමට කරුණු සෘජුවේ නම් අධිකරණය විසින් වහාම අතුරු ආරක්ෂක නියෝගයක් නිකුත් කළ යුතුය. අතුරු ආරක්ෂක නියෝගයක් නිකුත් කිරීම අවශ්‍ය නොවන බව අධිකරණයේ මතය වන විට අදාළ ඉල්ලීම ලැබී දින 14ක් ඇතුළත නඩුව විභාග කිරීමට දින නියම කළ යුතුය.

අතුරු ආරක්ෂක නියෝගයක් යනු ආරක්ෂාව වෙනුවෙන් නිකුත් කරන ක්ෂණික පිළියමකි. ආරක්ෂක නියෝගයක් නිකුත් කරන තෙක් හෝ නඩු විභාගය අවසන් වන තෙක් වගදැත්තරකරු විසින් සිදු කරන ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියාවලින් පීඩිත තැනැත්තා ආරක්ෂා කර ගැනීම මෙකී අරමුණකි. වගදැත්තරකාර පාර්ශ්වයට සවන් නොදී වුවද මෙකී නියෝගය නිකුත් කළ හැකිය. එසේම පීඩිත තැනැත්තාගේ හෝ එම පාර්ශ්වයේ සාක්ෂිකරුවන් නොවිඳිසා වුවද මෙකී නියෝගය නිකුත් කළ හැකිය.

- නඩුව අවසානයේ ආරක්ෂක නියෝගයක් නිකුත් කරන විට,
- නඩුව අවසානයේ ආරක්ෂක නියෝගයක් නිකුත් නොකළ යුතු යැයි අධිකරණය තීරණය කළ විට,
- නඩු විභාගයේදී අදාළ ආරක්ෂක නියෝගය ඉවත් කරනු ලැබූ විට,

අතුරු ආරක්ෂක නියෝගයක් අවසන් වේ.

ආරක්ෂක ආඥාවක් නිකුත් කළ හැක්කේ මාස 12ක කාලයකට. එනම් අවුරුද්දක කාලයකට පමණි. ආරක්ෂණ නියෝගයක් දීර්ඝව පවත්වාගෙන යෑම අවශ්‍ය නොවේ. වගදැත්තරකරු ප්‍රචණ්ඩකාරී ලෙස හැසිරෙන්නේ නැති බවට උසාවිය සෑහීමට පත් වූ විට මෙම ආරක්ෂක නියෝගය ඉවත් කොට පීඩාවට පත් පාර්ශ්වයට පීඩාව සිදු කළ අයට සමඟි වීමට හැකිය.

ආරක්ෂක නියෝගයක, අතුරු ආරක්ෂක නියෝගයක ඇතුළත් කළ හැකි තහනම් හා කොන්දේසි

- හවුලේ වාසය කරන ස්ථානයකට ඇතුළු වීම හා පදිංචිව සිටීම වැළැක් වීම.
- තමන් වාසය කරන ස්ථානයට, රැකියාව කරන තැනට ළමයකු සම්බන්ධ වන විට එකී ළමයාගේ පාසලට ඇතුළු වීම වැළැක්වීම.
- තාවකාලිකව හැවෙන සිටින ස්ථානයට ඇතුළු වීම වැළැක්වීම.
- එසේ හවුලේ වාසය කළ ස්ථානයට, වාසස්ථානයට හෝ එකී යම් කොටසකට ඇතුළු වීමෙන්, රැඳී සිටීමෙන් වැළැක්වීම.
- හවුලේ වාසය කරන නිවසක පදිංචිව සිටීම වැළැක්වීම.
- පීඩාවට පත් තැනැත්තාගේ යම් ළමයකු සමඟ සම්බන්ධතා පැවැත්වීම වැළැක්වීම.
- ජීඩාවට පත් පාර්ශ්වය හා වගදැත්තරකරු සිරිතක් වශයෙන් හවුලේ තුන්වැනි විදිහක නිශේචිත හා චංචල දේපළ ප්‍රයෝජනයට ගැනීම හා විඳීම වැළැක්වීම හා ඒවා තුළට ඇතුළුවීම වැළැක්වීම.
- ජීඩාවට පත් තැනැත්තා සමඟ සම්බන්ධතාවක් ඇති කර ගැනීමට උත්සාහ කරන විට එය වැළැක්වීම.
- පීඩාවට පත් තැනැත්තාට උදුවු කරන නෑයකු, මිතුරකු, සමාජ සේවකයකු, වෛද්‍යවරයකු හෝ වෙනත් යම් තැනැත්තකුට එරෙහි ප්‍රචණ්ඩ ක්‍රියා සිදු කිරීම.
- හිරිහැරයක් සිදුවන පරිදි පීඩාවට පත් තැනැත්තා පසුපස හඹා ඒම.

වැනි තහනම් හා කොන්දේසි ගෘහස්ථ ප්‍රචණ්ඩ ක්‍රියා වැළැක්වීමේ පනත යටතේ පීඩාවට පත්වන තැනැත්තකුට අධිකරණය හරහා ලබා ගැනීමේ හැකියාව ඇත.

නීතිඥ ගංගා ජයාංගනි සෝමරත්න
නීති ඉලධාර්
නීති ආධාර කොමිෂන් සභාව
කොළඹ

දෛනික ජීවිතයේදී මව්බිම පාඨකයන් ඉදිරිවට පත් කරන නීතිමය ප්‍රශ්න ගැන සෑම බදාදා දිනකම ගයිඩ්ලයින් පිටුවෙන් පිළිතුරු ලබාදේ. නීති ආධාර කොමිෂන් සභාවේ විදග්ධ නීතිඥ කණ්ඩායමෙන් විසින් සම්පාදනය කරනු ලැබේ.
ඔබේ ගැටලුව මව්බිම ලීගල් ඒඩ්, නීති ආධාර කොමිෂන් සභාව, 129, මහාධිකරණ සංකීර්ණය, අලුත්කඩේ, කොළඹ 12, දුරකථන 011 2433618 හෝ ඊමේල් legalaidcommission1978@gmail.com වෙත යොමු කරන්න.
උදෙස් සහ ලිපි සැකසුම
නීතිඥ දර්ශිකා මඩුගල්ලේ
නීතිඥ නිලූෂා කුමාරි විජේරත්න
නීති ඉලධාර්
නීති ආධාර කොමිෂන් සභාව

C M Y K